00034

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2016**

**තුලනාත්මක අධ්‍යාපනය – ESU4216**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 අප්‍රේල් 06** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමයේ පැවැති මට්ටම් තුන (03) නම් කරන්න.

02. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධව මෝර්ගන් කමිටුව ඉදිරිපත් කළ නිර්දේශ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. 1939 අධ්‍යාපන ආඥා පණත ගෙන ඒමට මූලික වූ කරුණ කුමක් ද?

04. 1961 ජාතික අධ්‍යාපන කොමිසම් යෝජනා කළ පාසල් ව්‍යුහය දක්වන්න.

05. ද.අප්‍රිකාව ක්‍රියාත්මක කළ වර්ණභේද ප්‍රතිපත්තියේ විශේෂ ලක්ෂණ තුනක් (03) දක්වන්න.

06. සංවර්ධිත රටවල අධ්‍යාපන ක්‍රමයන්හි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් (03) නම් කරන්න.

07. සම අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් (04) නම් කරන්න.

08. 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව හඳුනාගත් අධ්‍යාපනයේ ප්‍රධාන අඩුපාඩු මොනවා ද?

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. "ශ්‍රී ලංකාවේ ප්‍රථම බටහිර අධ්‍යාපනය ලන්දේසි අධ්‍යාපන ක්‍රමයෙන් ආරම්භ විය."

i. ලන්දේසි අධ්‍යාපන ක්‍රමයේ විශේෂ ලක්ෂණ දෙකක් (02) දක්වන්න. (ලකුණු 04)

ii. ලන්දේසීන් සහතික පිරිනැමීම සඳහා අනුගමනය කළ ක්‍රමය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ලන්දේසි පාසල් ක්‍රමය මගින් දෙනු ලැබූ අධ්‍යාපනයේ ප්‍රතිඵල කෙබඳු විද ? (ලකුණු 08)

10. මෝර්ගන් කමිටුවෙන් පසු ශ්‍රී ලංකාවට දැනෙන වෙනසක් ඇති කළේ 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටු නිර්දේශ වේ.

i. අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුව කරන ලද නිර්දේශ තුනක් (03) නම් කර ඉන් එකක් (01) ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

ii. සි.ඩබ්.ඩබ්.කන්නන්ගර විසින් හඳුන්වා දෙන ලද ත්‍රිභේදිත පාසල් ක්‍රමයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනය සඳහා නිදහසින් පසුව විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

i. ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීමට පක්ෂව ඉදිරිපත් වූ කරුණු හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

ii. 1972 දී හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අතුරින් විෂයමාලාවේ ඇති කරන ලද වෙනස්කම් හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. 1997 ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් මූලික නිපුණතා නම් කර, ඉන් එකක් විස්තර කරන්න.

(ලකුණු 04)

12. බහු වාර්ගික සමාජයන්හි අධ්‍යාපනික ගැටලු අවම කිරීම රජය සතු වගකීමක් වේ.

i. බහු වාර්ගික සමාජයක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

ii. ජාතීන් අතර සමගිය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව අධ්‍යාපනය තුළින් ගෙන ඇති පියවර හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. ඔබ ඉහතින් සඳහන් කළ ක්‍රියාමාර්ග අතුරින් එකක ඵලදායකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 12)

13. ජපානය ආර්ථික, සාමාජීය මෙන්ම තාක්ෂණික සංවර්ධනය සඳහා අධ්‍යාපනය මෙවලමක් ලෙස භාවිත කර ඇත.

(i) මෙයිජි පාලන සමයේ ජපානයේ ඇති කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නම් කරන්න. (ලකුණු 04)

(ii) ජපානයේ ද්විතියික විෂයමාලාවේ ස්වභාවය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) ජපාන අධ්‍යාපන ක්‍රමයේ දක්නට ලැබෙන ගැටලු හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකකට (02) කෙටි සටහන් ලියන්න.

(i) අධ්‍යාපනයේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව
(ii) එංගලන්තයේ ත්‍රෛපාර්ශ්වික පාසල් ක්‍රමය
(iii) හෘදය සාක්ෂි වගන්තිය
(iv) ජාත්‍යන්තරීකරණයෙන් ශ්‍රී ලංකාවට ඇතිවන වාසි

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇව්රිණි.